# අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

## සුදුසුකම්ලාභීන්ගේ නාම ලේඛනය ප්‍රසිද්ධ කිරීම සහ අභියාචනා / විරෝධතා කැඳවීම
## අස්වැසුම II අදියර සුදුසුකම්ලාභීන්ගේ දෙවන නාම ලේඛනය - 2026

2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ 11 වන වගන්තිය අනුව සුබසාධක ප්‍රතිලාභ ගෙවීම සඳහා සුදුසුකම්ලාභීන්ගේ නම් ලැයිස්තුව ප්‍රසිද්ධ කිරීම සහ එම නම් ලැයිස්තුවල ඇතුළත් නම් වලට හිමිකම්පෑම් සහ විරෝධතා කැඳවීම පිළිබඳ නිල නිවේදනයයි.



### සුදුසුකම්ලාභීන්ගේ නාම ලේඛනය ප්‍රසිද්ධ කිරීම

- අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2024 වර්ෂයට අයත් දෙවන අදියරේ සුදුසුකම්ලාභීන්ගේ දෙවන නාම ලේඛනය දිවයින පුරා පිහිටි සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහ ග්‍රාම නිලධාරි වසම් කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇත.
- සුදුසුකම්ලාභීන්ගේ නාම ලේඛනය සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ www.wbb.gov.lk නිල වෙබ් අඩවියට පිවිස දැක ගත හැකිය.

### දෙවන අදියරේ දෙවන අභියාචනා / විරෝධතා කැඳවීම

- සුදුසුකම්ලාභී දෙවන නාම ලේඛනයට අනුව සුදුසුකම් ලබා නොමැති හෝ තමා තේරී ඇති කාණ්ඩය පිළිබඳ සෑහිමකට පත් නොවන පවුල්/ තැනැත්තන් හට අභියාචනාවක් ඉදිරිපත් කළ හැකිය.
- ප්‍රසිද්ධකර ඇති නාම ලේඛනයේ අස්වැසුම ප්‍රතිලාභ ලැබීමට නුසුදුසු පවුල් හෝ තැනැත්තන් වේ නම් සහ එම නුසුදුසුතාවය තහවුරු කිරීමට හැකිනම් එවැනි අවස්ථාවක පොදු මහජනයාට විරෝධතා ගොනු කළ හැකිය.

### අභියාචනා / විරෝධතා ඉදිරිපත් කරන ආකාරය

- https://eservices.gov.lk වෙත පිවිස ඔබට මාර්ගගතව (online) අභියාචනා සහ විරෝධතා ඉදිරිපත් කළ හැකිය.

නැතහොත්,

- අයදුම්පත් මගින් අභියාචනා/විරෝධතා ඉදිරිපත් කළ හැකි අතර අයදුම්පත් බාගත කර ගැනීමට www.wbb.gov.lk නිල වෙබ් අඩවියට පිවිසෙන්න.

නැතහොත්,

- තමාට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හෝ ග්‍රාම නිලධාරී සහ වසම්භාර අස්වැසුම විෂය නිලධාරී වෙතින් අයදුම්පතක් ලබාගෙන එය පුරවා නැවතත් තමා අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාර දිය හැකිය.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සුබසාධක ප්‍රතිලාභ ඒකකයේ නිලධාරීන්ගේ තාක්ෂණික සහාය ඇතිව මාර්ගගතව තම අභියාචනා/විරෝධතා ඉදිරිපත් කළ හැකිය.
- ප්‍රදේශයේ බලය ලත් සන්නිවේදන මධ්‍යස්ථාන (Communication Center) මගින්ද අභියාචනා සහ විරෝධතා ඉදිරිපත් කළ හැකිය.
- එක් අභියාචනාකරුවෙක්ට ඉදිරිපත් කළ හැක්කේ එක් අභියාචනාවක් පමණි.
- නිර්නාමිකවද මහජන විරෝධතා ගොනු කිරීමට අවස්ථාව සලසා ඇත.
- අභියාචනා පද්ධතිගත කිරීමේදී සියලුම අභියාචනාකරුවන්ට සක්‍රිය, නිවැරදි ජංගම දුරකථන අංකයක් තිබිය යුතු අතර දැනට පද්ධතියේ සඳහන් වී ඇති ජංගම දුරකථන අංකය නිවැරදි නොවන හෝ අක්‍රිය තත්ත්වයේ තිබේ නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගොස් දත්ත පද්ධතියට නව ජංගම දුරකථන අංකය ඇතුළත් කළ යුතුය.

**අභියාචනා / විරෝධතා භාරගැනීම 2026 අප්‍රියෙල් මස 10 වන දිනෙන් අවසන් වේ**


සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD

ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, නො.191, ධර්මපාල මාවත, කොළඹ 07
ஜே ஆர் ஜெயவர்தன மையம், 191, தர்மபால மாவத்தை, கொழும்பு 7
J.R. Jayewardene Center, No.191, Dharmapala Mawatha, Colombo 07
0112 196 618 Fax :- 0112 196 613

1924
ක්ෂණික ඇමතුම